මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PE/2024/03** **2024.09.29**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

### තැපෑලෙන් ඡන්දය දීමට අපේක්ෂිත ඡන්දහිමියන් වෙත කෙරෙන දැනුම්දීමයි

ඉහත ඡන්ද විමසීමේ තැපෑලෙන් ඡන්දය දීමට අපේක්ෂිත සියලුම තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගේ තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම **2024.10.01** දින ආරම්භ වී **2024.10.08** දින අවසන් වේ. මේ සඳහා වලංගු ඡන්දහිමි නාමලේඛනය වන්නේ 2024 වර්ෂයේ සහතික කරනලද 2024(1) CR ඡන්දහිමි නාමලේඛනයයි. (2024 ජනාධිපතිවරණය සඳහා භාවිතා කරන ලද නාමලේඛනය)

**පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් සපුරා ඇති එමෙන්ම පසුගිය ජනාධිපතිවරණය සඳහා තැපැල් ඡන්ද අයදුම්කළ සියලුම දෙනා මෙම ඡන්ද විමසීම සඳහා නැවතත් ස්වකීය තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්යය බව අවධාරණය කරනු ලැබේ.**

ඒ අනුව සුදුසුකම් සපුරා ඇති සියලු අයදුම්කරුවන්ගේ අයදුම්පත් 2024.10.08 දින හෝ එදිනට පෙර අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී (දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල) වෙත ලැබී තිබිය යුතු බව සියලුම ආයතන ප්‍රධානීන්, සහතික කිරීමේ නිලධාරීන් හා තැපැල් ඡන්දහිමියන් වෙත වැඩිදුරටත් දන්වා සිටිමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්